හොරණ නගර සභාව
කළුතර දිස්ත්‍රික්කය
---------------------------------

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින සභාපතිවරයාට යවා ඇත.

1:2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට හොරණ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1:3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1:3:1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ ඉඩම් විකිණීම මත බදු ආදායම වූ රු.250,025 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පත් ආයෝජන වටිනාකම ආයෝජන සහතික පත්‍ර අනුව රු.26,861,105 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.25,751,244 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර තැන්පත් ආයෝජන වටිනාකම රු.1,109,861 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.2,651,531 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.1,609,760 ක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් ස්ථාවර තැන්පත් පොලී ආදායම රු. 1,041,771 අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ කුලී ආදායම රු.5,400 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ප්‍රින්ටරයක් මිලදී ගැනීම සඳහා වැය කළ රු.106,000 ක මුදල ප්‍රාග්ධන වැය යටතේ දක්වා නොතිබුණි.

(ඊ) 06 වන වැඩසටහනෙහි පුනරාවර්තන වැය යටතේ දැක්විය යුතු රු.1,537,598 ක් ප්‍රාග්ධන වැය යටතේ දැක්වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන වැය රු.1,537,598 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාළව පුස්තකාල පොත් මිලදී ගැනීම හා පුස්තකාල පොත් පරිත්‍යාගවල වටිනාකම රු.1,613,022 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.1,588,169 ක් ලෙස ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් හා ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුම් රු.24,853 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) ගිනි නිවීමේ උපකරණ සවි කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.199,000 ක් ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුම් රු.199,000 බැගින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාළව වියදම් ණයහිමි වටිනාකම රු.167,638 ක් අඩුවෙන් දැක්වීම හේතුවෙන් ණය හිමි වටිනාකම හා සමාලෝචිත වර්ෂයේ වියදම රු.167,638 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) වැඩිපුර අය කරන ලද රු.4,500 ක් වූ සේවක ණය ගෙවිය යුතු ශේෂයක් ලෙස ගිණුම්වල දක්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සේවක ණය ශේෂය රු.4,500 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) ඉකුත් වර්ෂයන්ට අදාලව සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබූ රු.7,330,395 ක් වූ මුද්දර ගාස්තු ආදායම සමුච්චිත අරමුදල් ගිණුමට බැර නොකර වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ණයහිමි ගිණුමට හර කළ යුතු එකතු අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු හා මුද්දර බදු පිළිවෙලින් රු.96,790 ක් රු.39,216 ක් හා රු.2,300 ක් අදාළ බදු ගිණුම් වලට හර කර තිබුණි. තවද 2017 දෙසැම්බර් 31 දිනට අදාළ බදු ගිණුම්වල දැක්විය යුතු එකතු අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු හා මුද්දර බදු පිළිවෙලින් රු.96,703 ක්, රු.39,216 ක් හා රු.5,315 ක් ණය හිමි ගිණුමට මාරු කර තිබුණි. වර්ෂ ගණනාවක් තිස්සේ මෙසේ වැරදි ආකාරයට ගිණුම් තැබීම නිසා ණයහිමි ගිණුමේ හා අදාළ බදු ගිණුම්වල 2017 දෙසැම්බර් 31 දිනට ශේෂයන් නිවැරදි නොවිය.

1.3.2 <u>**නොසැසඳුණු ගිණුම්**</u>

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.68,136,906 ක් වූ ගිණුම් විෂයයන් 11 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී රු.18,836,960 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ මුළු තැන්පතුවලට අදාළ විග්‍රහයේ මාර්තු සහ ඔක්තෝබර් මාසයන්හි තැන්පත් ලැබීම් පිළිවෙලින් රු.821,889 ක් සහ රු.303,627 ක් සටහන් කර තිබුණද, සාරාංශ ආදායම් ලේඛනය අනුව එම වටිනාකම පිළිවෙලින් රු.816,889 ක් හා රු.304,627 ක් විය.

1.3.3 <u>**ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**</u>

<u>ලැබිය යුතු ගිණුම්</u>

සුපිරි වෙළඳසැල් ගොඩනැගිල්ලේ ඇති කඩ කාමරවලින් අය නොවන ශේෂයක් ලෙස රු.426,979 ක මුදලක් හා රථවාහන නවතා තබා ගැනිමේ ගාස්තු රු.69,134 ක හිඟ ශේෂයක් ගිණුම්වල දිගින් දිගටම දක්වා තිබුණි.

1.3.4 <u>**විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**</u>

<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.111,522,188 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය / සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1:3:5 <u>**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) නගර සභා ආඥා පනත (255 අධිකාරය) | - | වාහන නවතා තබා ගැනීමේ ස්ථාන සඳහා අතුරු ව්‍යවස්ථා ගැසට් කර |

| | | |
|---|---|---|
| 193 වගන්තිය | | ඇතත් ගාස්තු විධිමත්ව අය කිරීමට වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i)මුදල් රෙගුලාසි 371(ඇ) | 3,298,470 | කිසියම් කාර්යයක් සඳහා දෙන ලද අත්තිකාරම් මුදලක් අදාළ කාර්යය නිම වූ වහාම පිය විය යුතු වුවත් 2013 ට පෙර සිට පැවත එන අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| | 1,806,714 | සෑම අර්ධ වර්ෂයකම අවසානයේදී ඉකුත් වූ සියලුම තැන්පතු පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571(1)(2) | | |
| (iii) මුදල් රෙගුලාසි 756, 757 හා මුදල් රෙගුලාසි 1647(අ) | ---- | වාහනයේ උපකරණ පිළිබඳව සම්පූර්ණ සමීක්ෂණයක් හා නිලධාරියෙකුගෙන් තවත් නිලධාරියෙකුට වාහනය භාර දෙනු ලබන අවස්ථාවේදී වාහන සමීක්ෂණයක් සිදු කර නොතිබුණි |
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ජේදය | ---- | ආයතනය සතු සියළුම වාහනවල ඉන්ධන දැවීම වාර්ෂිකව පරික්ෂා කර නොතිබුණි. |
| (ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ 2016 නොවැම්බර් 03 දිනැති අංක LGD/13/2016 දරන චක්‍රලේඛය | ---- | සභාව සතු දේපළ මුල් බදුකරුවන් විසින් අතුරු බදු දී ඇති අවස්ථාවක එම අතුරු බදුකරුවන් බදුකරුවන් කර නොතිබුණි. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2:1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.27,311,671 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,329,552 ක් විය.

2.2 <u>මූල්‍ය පාලනය</u>

අංක 719675 දරන නාගරික සංවර්ධන අධිකාරී ජංගම ගිණුමේ 2009 වර්ෂයේ සිට නිශ්කාර්යව පවතින රු.99,885 ක ශේෂය ඵලදායී කාර්යයකට යොදා ගැනීම සඳහා 2018 මැයි 17 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

2:3 **<u>ආදායම් පරිපාලනය</u>**

2:3:1 <u>ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර්31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 15,750,000 | 15,840,487 | 18,957,810 | 3,937,510 | 15,750,000 | 15,424,638 | 16,892,762 | 6,272,965 |
| (ii) කුලි | 8,815,072 | 8,910,082 | 8,499,647 | 2,824,764 | 5,524,440 | 5,809,009 | 6,517,284 | 2,153,324 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,200,000 | 2,014,260 | 2,013,260 | 30,500 | 2,200,000 | 2,347,580 | 2,404,220 | 29,500 |

2.3.2 **<u>වරිපනම් හා බදු</u>**

(අ) **<u>වරිපනම්</u>**

i. සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.5,218,716 ක වරිපනම් හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.3,711,381ක් හෙවත් සියයට 71 ක් අයකරගෙන තිබුණි.

ii. සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කිරීම් රු.14,788,315 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.313,081ක් කපා හැර තිබුණි. වර්ෂය තුළ ලැබීම් රු.13,350,949 ක් හෙවත් සියයට 92.1 ක් විය.

iii. සමාලෝචිත වර්ෂයේ ආරම්භක වරිපනම් බදු හිඟයෙන් වර්ෂය අවසානයට අයවිය යුතු හිඟ වරිපනම් බදු ශේෂය රු.1,307,353 ක් වූ අතර ඉන් වර්ෂ 3 ඉක්ම වූ හිඟය රු.296,501 ක් ද, වර්ෂ 5 ඉක්ම වූ හිඟය රු.221,984 ක් හා වර්ෂයට වඩා වැඩි හිඟය රු.193,880 ක් ද විය. දීර්ඝ කාලීනව පවතින වරිපනම් බදු සම්බන්ධයෙන් පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) <u>විනෝද බදු</u>

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ විනෝද බදු රු.1,068,598 ක් වූ අතර වාර්ෂික බිල් කිරීම් රු.1,052,172 ක් විය. ප්‍රවර්තන වර්ෂයේ ලැබීම් රු.1,056,123 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට හිඟය රු.1,064,647 ක් විය.

2.3.3 **<u>කුලී</u>**

<u>කඩ කුලී</u>

(i) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.2,150,174ක කඩ කුලී හිඟයක් පැවති අතර වර්ෂය තුළදී ඉන් රු.1,485,953 ක් හෙවත් සියයට 69 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ කඩ කුලී බිල් කිරීම් රු. 8,905,582 ක් වූ අතර ඉන් රු. 6,870,673 ක් වර්ෂය තුළ අය කර ගෙන තිබූ බැවින් තව දුරටත් අය කිරීමට ඇති ශේෂය රු. 2,034,909 ක් විය.

(iii) ගිවිසුම් කාලය අවසන් වූ මාළු වෙළඳ සැල් 07 ක් සඳහා ගිවිසුම් අළුත් කිරීමට හෝ වෙනත් පාර්ශව කරුවන්ට ලබා දීමට හෝ කටයුතු කර නොතිබුණි.

2.3.4 <u>බලපත්‍ර ගාස්තු</u>

(අ) **<u>කර්මාන්ත බදු</u>**

සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.14,500 ක කර්මාන්ත බදු හිඟයක් පැවති අතර වර්ෂය තුළදී ඉන් රු.2,000 ක් පමණක් අයකරගෙන තිබුණි. තවද අයවීමට තිබූ හිඟ බදු ශේෂය වූ රු.12,500 න් රු.7,500 ක් සඳහා නඩු පවරා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට අයවීමට තිබූ සම්පූර්ණ කර්මාන්ත බදු මුදල රු.12,500 ක් විය.

(ආ) <u>ව්‍යාපාර බදු</u>

සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ ව්‍යාපාර බදු ආදායම රු.15,000 ක් වූ අතර වර්ෂයට අදාළ බිල් කිරීම් රු.1,535,760 ක් විය. වර්ෂයේ ලැබීම් රු.1,532,760 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ආදායම රු.18,000 ක් විය.

2.3.5 <u>වෙනත් ආදායම්</u>

(අ) **<u>රථවාහන නවතා තැබීමේ ගාස්තු</u>**

සභා බල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ නවතාතැබීමේ ස්ථානවල නවතා තබන ත්‍රීරෝද රථවලින් ගාස්තු අයකර ගැනීම සඳහා 2017 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අතුරු ව්‍යවස්ථා පනවා ගෙන ඇතත් සමාලෝචිත වර්ෂය තුළදී ගාස්තු අයකිරීමක් සිදුකර නොතිබුණි.

(ආ) **<u>දැන්වීම් පුවරු ආදායම්</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 දෙසැම්බර් 23 දිනැති අංක 1999 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති ආකාරයට සභා බල ප්‍රදේශයේ සවි කර ඇති දැන්වීම් පුවරු/ ප්‍රචාරක දැන්වීම් වලින් ගාස්තු අය කර ගැනීම සඳහා සභාව විසින් 2017 වර්ෂයේදී සිදු කළ සමීක්ෂණයට අනුව දැන්වීම් පුවරු 73 කින් රු.657,375 ක් අයකළ යුතු වුවත්, ඉන් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. තවද, 2016 වර්ෂයේදි සිදු කළ සමීක්ෂණය අනුව ස්ථිර දැන්විම් පුවරු 26 කින් රු.87,700 ක ආදායම් ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **<u>රථවාහන කුලී</u>**

සමාලෝචිත වර්ෂය ආරම්භයට තිබූ රු.54,887 ක් වූ රථවාහන කුලී හිඟය අයකර ගැනීමට 2016 වර්ෂයේදී නඩු පවරා ඇතත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කුලී අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

2.3.6 **<u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>**

**<u>උසාවි දඩ</u>**

1980 අංක 26 දරන ආහාර හා ඖෂධ පනතේ විධිවිධානයන්ට අනුකූල නොවන ලෙස නගර සභා සීමාව තුළ ආහාර අලෙවි කරන ලද ස්ථානවලට එරෙහිව 2014, 2015, 2016 හා 2017 වර්ෂ වලදී පවරන ලද නඩුවලට අදාළව ලැබිය යුතු රු.148,500 ක මුදලක් සභාවට ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3:1 <u>කාර්ය සාධනය</u>

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරිම , ජනතාවගේ සුබ විහරණය , පහසුව සහ සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරිම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

නගර සභා ආඥා පනතේ 157 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 4 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

(i) සභාව විසින් 2017 වර්ෂය වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන කර්මාන්ත පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ii) 2017 වර්ෂයේ ප්‍රාග්ධන වැය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා සභා කර්මාන්ත 25 ක් වෙනුවෙන් රු.26,580,000 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබූ අතර ඉන් රු.21,107,581 ක් වූ කර්මාන්ත 20 ක් පමණක් ඉටුකර තිබුණි.

(ඇ) **<u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>**

සභා බල ප්‍රදේශයේ එක් රැස් වන නොදිරන කුණු කසළ බැහැර කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් නොමැති වීම හා එම කාර්යය බාහිර පාර්ශවයක් ලවා සිදු කිරීම නිසා 2017 වර්ෂය වෙනුවෙන් රු.3,662,875 ක් වන විශාල වියදමක් දැරීමට සභාවට සිදු වී තිබුණි. මෙම පිරිවැය ආවරණය කිරීම සඳහා කසළ බදු පැනවීම ඇතුළු අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා තිබුණත් කසළ බදු පනවා නොතිබුණි.

(ඈ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව නගර සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් නගර සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍යය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 ජූනි 11 දින වන විටත් සකස් කර නොතිබුණි.

3:2 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු සිටිය යුතු ලේකම් තනතුරේ වැඩ ආවරණය කිරිමට කළමනාකරණ සහකාර අධිශ්‍රේණියේ නිලධාරියෙකු පත් කර තිබුණි.

(ආ) තෘතියික මට්ටමේ 04 ක් ද්විතියික මට්ටමේ 03 ක් හා ප්‍රාථමික මට්ටමේ 09 ක් වශයෙන් සේවක පුරප්පාඩු 17 ක් විය.

3:3 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

**<u>ගිනි නිවීමේ ඒකකය</u>**

(i) නගර සභා බල ප්‍රදේශයෙන් පිටත ගිනි නිවන සේවා සැපයීම , අළුතින් ඉදිකරන ගොඩනැගිලි සඳහා ගිනි නිවාරණ සහතික ලබා දීම , ගොඩනැගිලි සැලසුම් හා ගිනි ආරක්ෂණ පද්ධති සහතික

කිරීම හා ගිලන් රථ සේවා සැපයීම යනාදී කටයුතු වෙනුවෙන් අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ගෙන ගාස්තු අයකිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ii) සභා සීමාවෙන් පිටත කර්මාන්ත ශාලා සඳහා හානි ආවරණ සහතික ලබා දීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් නොමැති වීම හේතුවෙන් අවශ්‍යතාවය මත පැමිණෙන ආයතන සඳහා සභා තීරණයක් මත ගාස්තු අය කර ගිනි ආවරණ සහතික ලබා දීම පමණක් සිදු කර තිබුණි.

(iii) ගිනි නිවන ඒකකය සතු වාහනයක් 1994 වර්ෂයේ සිට ලියාපදිංචි කිරීමකින් තොරව නිශ්ක්‍රීයව පැවතුණි. හීනෝ වර්ගයට අයත් ජපන් වාහනයක් වූ මෙම වාහනය පිළිබඳ කිසිදු ලියවිල්ලක් සභාව සතුව නොතිබුණි.

(iv) ගිනි නිවන ඒකකය සතුව පවතින කැබ් රථයක් 2017 අගෝස්තු මාසයේ සිට නගර සභා ප්‍රධාන කාර්යාලයේ ධාවන කටයුතු සඳහා යොදවා ගෙන තිබීමෙන් ගිනි නිවන ඒකකයේ කටයුතු මනා ලෙස පවත්වා ගැනීමට නොහැකි වී තිබුණි.

3:4 <u>වත්කම් කළමනාකරණය</u>

3.4.1 <u>වත්කම්වල ආරක්ෂාව තහවරු නොකිරීම</u>

(අ) ළමා ක්‍රීඩාංගනයේ කොටසක බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් වෙළඳසැලක් පවත්වාගෙන යමින් තිබූ අතර එය ඉවත් කිරීම සඳහා සභාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) වැවල පෙර පාසැල පිහිටි සභාවට අයත් ඉඩමෙන් පර්චස් 10 ක ප්‍රමාණයක් බාහිර පාර්ශවයක් විසින් අනවසරයෙන් අත්පත් කරගෙන තිබූ අතර, එම ඉඩම් කොටස ආපසු ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1994 වර්ෂයේදී සොරණවත්ත වෙන්දේසි ඉඩමෙන් පොදු පහසුකම් සඳහා සභාවට වෙන් කර ඇති රූඩ් 02 පර්චස් 06 ක ඉඩමෙන් කොටසක් යාබද ඉඩම් හිමියා විසින් අනවසරයෙන් අල්ලා ගෙන තිබූ අතර එම කොටස නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාවට අයත් අක්කර 1 රූඩ් 02 පර්චස් 13 ක් විශාල හල්ගල්ගොඩැල්ල ඉඩමේ අනවසර පුද්ගලයින් විසින් නිවාස තනාගෙන පදිංචි වී තිබුණි.

3.4.2 <u>පවරා නොගත් වත්කම්</u>

නගර සභාව පරිහරණය කරන හොරණ පුස්තකාල ගොඩනැගිල්ල හා ඉඩම , හොරණ පරණ නගර සභා ගොඩනැගිල්ල හා ඉඩම, මහජන ක්‍රීඩාංගනය, ළමා ක්‍රීඩාංගනය, ළමා ක්‍රීඩාංගනය අසල පෙර පාසල හා ගිනි නිවීමේ ඒකකය පිහිටි ඉඩම සඳහා හිමිකම් ඔප්පු නොතිබුණි.

3.4.3 **<u>නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්</u>**

(අ) 2016 ජුනි මාසයේ ආරම්භ කර තිබූ කායවර්ධන මධ්‍යස්ථානයෙන් ප්‍රයෝජන ලබන්නන්ගේ ප්‍රමාණයේ අඩුවක් දක්නට ලැබුණු බැවින් ඉන් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ අල්ප වී තිබුණි.

(ආ) 2009 වර්ෂයේදී රු.5,200,445 ක වියදමකින් ඉදි කර ඇති වැසිකිලි පද්ධතිය හා නාන කාමරය යන දෙකෙන් වැසිකිලි පද්ධතිය පමණක් මහජන පරිහරණය සඳහා භාවිතා කරන නමුත් නාන කාමර පද්ධතිය කිසිදු ප්‍රයෝජනයක් නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

3:5 <u>තොග ඌනතා</u>

ගෑස් සිලින්ඩර් 20 ක් මිලදී ගැනීම සඳහා රු. 104,950 ක මුදලක් ගෙවා තිබූ නමුත් ගබඩාවට ගෑස් සිලින්ඩර් ලබා ගැනීමේදි සිලින්ඩර් 02 ක ඌනතාවයක් තිබූ අතර , එහි වටිනාකම රු.10,495 ක් විය.

4. **<u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

**<u>අයවැය පාලනය</u>**

අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. **<u>පද්ධති හා පාලන</u>**

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරික්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

| <u>පද්ධතිය</u> | | <u>අඩුපාඩුව</u> |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | i. | ගිණුම් වලින් අත් හැරීම්,අඩුවෙන් හා වැඩියෙන් සටහන්වීම් තිබීම |
| | ii. | ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම |
| (ආ) ආදායම් පරිපාලනය | i. | හිඟ බදු අයකිරිම ප්‍රමාණවත් පරිදි සිදු නොවීම |
| | ii. | බදු තක්සේරුව නියමිත කලට සිදු නොකිරීම |
| (ඇ) අයවැය | i. | අයවැය හා තථ්‍ය වියදම් අතර විශාල විචලනයක් පැවතීම |
| | ii. | ආදායම් ඇස්තමේන්තු තාත්වික නොවීම |
| (ඈ) තොග පාලනය | | ලැබීම් හා නිකුත් කිරීම් පිළිබඳ අධික්ෂණයක් සිදු නොවීම |
| (ඉ)අපද්‍රව්‍ය කළමනාකරණය | | විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොවීම |
| (ඊ) ස්ථාවර වත්කම් | i. | ලේඛන යාවත්කාලීන කර නොතිබීම |
| | ii. | වත්කම්වල ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබීම |